# කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනය

පල්ලාවෙල සද්ධාතිස්ස නාහිමිපාණන් වහන්සේ

**කෝට්ටේ යුගය:**

ක්‍රි.ව. 1410 දී කෝට්ටේ රාජධානි යුගය ආරම්භ විය. පසළොස්වන සියවසෙහි ආරම්භවී එක් සිය අට සැට වර්ෂයක් පමණ කාලයක් තුළ මේ රටේ පාලන තන්ත්‍රය ක්‍රියාත්මක වූයේ කෝට්ටේ රාජධානියෙනි. 1415 දී සවන සිරි පැරකුම්බා රජතුමා ලංකාවේ රජකමට පත්විය. ලක්දිව එක් සේසත් කරමින් ලක්දිව මහ රජකමට පත් වූ සිරි පැරකුම්බා රජතුමා කෝට්ටේ නගරය රාජධානිය කරගෙණ තෙජෝ බල පරාක්‍රමයෙන් යුක්තව රටේ සාමයත්, නිදහසත්, සෞභාග්‍යයත්, සමෘද්ධියත් ඇති කෙළේ ය. ස වන පැරකුම්බා රජතුමාගේ කාලයේ දී මුළු රටේ ම සාමකාමී වාතාවරණයත් සමග ආගමික වූ ද සංස්කෘතික වූ ද දියුණුවක් ද අපූර්ව සාහිත්‍ය දියුණුවක් ද ඇති විය. ස වන පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ ලංකාවේ අගනුවර වශයෙන් පිළිගන්නා ලද්දේ කෝට්ටේ නගරයයි. කෝට්ටේ එදා ජයවර්ධන පුරය නමින් හඳුන්වන ලදී. ජයවර්ධන පුරය ආරම්භ කරණ ලද්දේ අලගක්කෝණාර නම් ප්‍රභු රාජයන් විසිනි. අලගක්කෝණාර තුමා කැලණි නගරයෙන් දකුණු දිශාවෙහි වූ කෝට්ටේ ප්‍රදේශයෙහි ප්‍රාසාද, බෝධි ප්‍රාකාර, සක්මන් මලු, ප්‍රතිමා ගෘහ, චෛත්‍යාදියෙන් යුක්ත ප්‍රාසාද පංක්ති, දොර කොටු ආදියෙන් ද යුත් ජයවර්ධන කෝට්ටය නම් වූ නගරය නිර්මාණය කොට එහි වාසය කරමින් ශාසනයේ දියුණුව ද, අප්‍රමාණ කුසල් ද කළ බැව් මහාවංශයේ ඇතුළත්,

ඉච්චාදි වණ්ණිත මහා මුනි සෙවිතම්හා
කල්‍යාණි නාම නගරා අපි **දක්ඛිණස්මිං**
බුද්ධාදි යුත්ත ජනකප්පිත සාධු ඨානෙ
දරුරු ගාම නිකටෙ මහති තලාකෙ

පාසාද බොධි වර චංකම මණ්ඩපෙහි
පාකාර සාල පටිමාලය චෙතියෙහි
කල්‍යාණි නාම නගරී රුචිරා පණෙහි
රාජෙති චාරුතර ගොපුර තොරණෙහි

මහා පාකාර පන්තීහි ද්වාර කොට්ඨාදි සොභිතං
ජය වද්ධන කොට්ටන්ති පසිද්ධං නගරං අකා
වසනෙතා සො පුරෙ තස්මිං පුඤ්ඤකාමො මහබ්බලො
සාසන වුද්ධි ආදිකං අකාසි කුසලං **බහුං**[1]

යන මේ ගාථාවන්ගෙන් ප්‍රකට වෙයි.

ජයවර්ධන පුර කෝට්ටය බලකොටුවක් වශයෙන් නිර්මාණය කරණ ලද්දේ වීර අලකේශ්වරයන් විසිනි. උතුරේ යාපනය අර්ධද්වීපයේ ආර්ය චක්‍රවර්ති නම්

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

අධිපතියා යටත් කර ගැනීමේ කටයුතු මෙහෙයවීම සඳහා අලකේශ්වරයන් විසින් මේ නගරය නිර්මාණය කරණ ලද බැව් කියති. කෝට්ටේ රාජධානිය පහත රට පැරණි ම රාජධානිය බැව් කිව යුතුය. සතුරන්ට පිවිසෙන්නට නොහැකි පරිදි බලකොටුවක් ලෙස නිර්මාණය වී පැවතීම නිසා මේ රාජධානිය කෝට්ටේ නමින් ප්‍රසිද්ධ වන්නට ඇතැයි සිතිය හැකි ය. මේ නගරයේ සම්පූර්ණ නාමය ජයවර්ධන කෝට්ටය බැව් මහාවංශයේ සඳහන් "ජයවද්ධන **කොට්ටනන්ති**"[2] යන යෙදීමෙන් ප්‍රකට වේ. කොට්ටේ ජයවර්ධන පුරය දියුණු කරණ ලද්දේ යාපන අර්ධද්වීපයේ අධිපති ව සිටි ආර්‍ය්‍ය චක්‍රවර්තීන් යටත් කිරීමේ අදහසිනි. ජයවර්ධන පුර කෝට්ටේ තත්ත්වයත් එහි නිර්මාතෘවරයා පිළිබඳ තත්ත්වයත් ඇතුළත් නිකාය සංග්‍රහයෙහි දක්නට ලැබෙන පාඨයක් මෙහි සඳහන් කරමි.

"ඉක්බිති ඒ බුවනෙකබාහු මහරජාණන්ගේ ඇවෑමෙහි රජය ලත් පැරකුම් රජහු අවසන එම පුරයෙහි රජ පැමිණි වික්‍රමබාහු මහ රජාණන් දවස ගිරිවංශාභිජාත අලගක්කෝණාර නම් මන්ත්‍රීවරයාණ කෙනෙක් මහත් වූ තෙජො බල වික්‍රමයෙන් ලොක පූජිත ව **වසන්නාහු** ශ්‍රී ලංකාද්වීපයෙහි ලොක ශාසන විලොපකාරී වූ පරශත්‍රු ප්‍රතිබාධනය පිණිස ස්වාර්ත්ථ පරාර්ථ ප්‍රතිබද්ධ චිත්ත ප්‍රවෘත්ති ඇති, ශ්‍රද්ධා භක්ති පුරඃසාර සකලාභිමතාර්ත්ථ සාධා දීමෙහි **සමර්ථවූ** ස්ථානොචිත කාර්‍ය්‍යාකාර්‍ය්‍ය විජානනයෙහි දක්ෂ විචක්ෂණ ගුණී, සුවච, කීකරු, සෙවක මණ්ඩලිකයන් ලවා විධාන කරවා කොලොම්බාභිධාන, ද්‍රොණ මුඛාසන්නයෙහි නිරන්තරව දිය පිරි සුරක්ෂිතව වටා සිටි තඩාග මධ්‍යයෙහි දරු ග්‍රාමය සිසාරා ගම්භීරතර පර්වත ප්‍රාන්තයක් මෙන් අතිභයානක වූ ගැඹුර හා පුළුල ඇති මහ අගල බිඳවා ස්ථිරත්වය පිණිස අගල පටන් මුදුනෙහි බඳනා ලද සර්ව ශෛලමය මහා ප්‍රාකාර මස්තකයෙහි අතරතුර විශ්ව කර්ම නිර්මාණයක් මෙන් විචිත්‍ර කොට සරසා ඒ ඒ තන්හි කරණ ලද ඉත්වංගනී පුලිමුගම් භූමි අං තට්ටු, අට්ටාල වට්ට වෙට්ටයන් සුරක්ෂිතකොට අභිනව ජයවර්ධන යන නමින් **ප්‍රසිද්ධ කෝට්ටයක් ලවා**[3]" **නිකාය සංග්‍රහාගත මේ පාඨයෙහි ජයවර්ධන පුර කෝට්ටෙ** පිළිබඳ තාත්වික සංඥාපනයක් ඇතුළත් වෙයි.

ජයවර්ධන පුරය එද ශ්‍රී සෞභාග්‍යයෙන් පරිපූර්ණ වූ ශ්‍රේෂ්ඨ නගරයක් ව පැවැති බැව් නොයෙක් කවියන්ගේ වැණුම්වලින් ද ප්‍රකට වෙයි. සැළලිහිණි, මයුර, ආදි සන්දේශ වල ද ජයවර්ධන පුරය පිළිබඳ විචිත්‍ර කාව්‍යමය රමණීය වැණුම් දක්නට ලැබේ. මයුර සන්දේශ කතුවරයා මයුරයාට ජයවර්ධන පුරය හඳුන්වා දෙන්නේ මනහර මහා වීථිවලින් යුත් මහා ධනවත් සත් පුරුෂයන් වාසය කරණ හස්ති, අශ්ව, රථ සේනාවලින් යුත් ශ්‍රීයෙන් සාරවූ ශ්‍රේෂ්ඨ නගරයක් වශයෙනි. ඒ බැව්,

ලෙස . ලද්දන සිය කුල සිය **ගුණෙන්** සර
රැඳි සද්දන සැදි මහ වීදි මන හර
ජය වද්දන ගජ හය රිය සෙන් නිතො ර
ජය වද්දන පුර සිරි සර බල මොන ර[4]

යන රසවත් හරවත් පැදියෙන් දක්වා ඇත.

පසළොස්වන සියවසෙහි ප්‍රථම භාගයෙහි ලක්දිව විසූ මහා බලසම්පන්න වීරයා වශයෙන් ජීවත් වූ අලකෙශ්වර ජයවර්ධන **කෝට්ටය** සකලාංගයන්ගෙන් සම්පූර්ණ වූ නගරයක් බවට පත් කළ නමුත් ඔහු නරේන්ද්‍රයකු නො වූහයි කියති.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

**ජයවර්ධන පුර කෝට්ටේ රජවරු:** :

ජයවර්ධන පුර කෝට්ටේ නගරය නිර්මාණය කොට දියුණු කළ අලකේශ්වර යන්ගේ බෑනා වූ වීර අලකේශ්වර පරදවා වර්ෂ 1415 දී සවන පැරකුම්බා කුමාර නෙමේ කෝට්ටේ පළමු රජතුමා විය. එයින් පසු දෙවන ජයබාහු, සවන බුවනෙකබාහු, සත්වන පණ්ඩිත පරාක්‍රමබාහු, අට වන වීර පරාක්‍රමබාහු, නව වන ධර්ම පරාක්‍රමබාහු, සත් වන විජයබාහු, සත් වන භුවනෙකබාහු, දොන් ජුවන් ධර්මපාල යන නම්වලින් යුත් රජවරු ජයවර්ධන පුර රාජධානියේ රජකළ[5] කළහ.

ස වන ශ්‍රී පරාක්‍රමබාහු රජතුමා ක්‍රි.ව. 1412 දී ජයවර්ධන පුර කෝට්ටේ **රජකමට** පත්වියයි. ඇතැම් ඉතිහාස පුවත් වලින් හෙලිවෙයි. ක්‍රි.ව. 1412 සිට 1580 තෙක් ජයවර්ධන පුර කෝට්ටේ රාජධානි කාලය වශයෙන් සැළකිය යුතුය. මේ කාලය තුළ ජයවර්ධන පුරයේ රජ කළ රජවරු නව දෙනා අතුරෙන් වර්ෂ 1412 සිට 1467 තෙක් රජකළ ස වන සිරි පැරකුම්බා රජතුමාගේ රාජ්‍ය කාලය කෝට්ටේ සාහිත්‍ය යුගය වශයෙන් සලකනු ලැබේ.

ස වන සිරි පැරකුම්බා රජතුමා :

මේ රජතුමා ධර්මාශෝක රජතුමාගේ පරපුරෙහි වූ ජයමාල නම් රජතුමාගේ හා කාලිංග රාජ කුලයෙහි උපන් සුනේත්‍රා නම් දේවියගේ පුත්‍ර රත්නයකි.[6] පැරකුම්බා සිරිතෙහි මේ රජතුමාගේ පියා පයමහලැන නම් රජෙකු බවද, සුනේත්‍රා මහා දේවිය මැණියන් වූ[7] බවද සඳහන් වී ඇත. මේ ස වන පැරකුම්බා රජතුමා අභීත රණ ශූර යෙකි. සාහිත්‍ය ධරයෙකි. මෙතුමා ලම්බ කර්ණ වංශයෙහි **ජයමහලෑන** රජතුමාගේ පුත්‍රයා බවද ශ්‍රද්ධා ප්‍රඥා ආදී ගුණ මිණිවලට **සුරතුරක්** වැනි බවද සියලු නරේන්ද්‍රයන්ට මුදුන් මල් කඩක් වැනි බවද, සිරි රහල් මා හිමියෝ[8] ප්‍රකාශ කරති. ස වන සිරි පැරකුම්බා රජතුමා දළදා වහන්සේට තෙ මහල් මන්දිරයක් කරවිය. දළදා වහන්සේ තැන්පත් කරවීමට නවරත්න බැඳි රන් කරඬුවක් ද ඒ කරඬුව තැබීමට තවත් කරඬුවක් ද, එය තැබීමට තවත් කරඬුවක් ද, එය තැබීමට තවත් කරඬුවක් දැයි රන් කරඬු සතරක් දළදා වහන්සේ සඳහා කරවිය. තෙරුවනට නොයෙක් පුද පූජා කළ මේ රජතුමා භික්ෂූන් වහන්සේට **කඨින** චීවර පූජා ද කරවූ බැව් මහා වංසයෙහි[9] සඳහන් වෙයි.

ස වන සිරි පැරකුම්බා රජතුමා බල වාහන සේනාවක් සහිත ව දුර්ග ස්ථානවල සැඟවී සිටි සතුරු රජවරුන් පරාජය කෙළේය. තමාගේ තෙද ද අණසක ද පතුරුවා ලක්දිව එක්සේසත් කෙළේය. මේ බැව් ගිරා සන්දේශ කතුවරයා ද පවසන්නේ

බල කොට ගිරි මුලු        ළු
බල සෙන් සමග තෙද        රළු
උන් තැන තැන අමු        ළු
නැබුළු විකුමැති නොයෙක් රජ        මුළු

රජ ගෙණ මුළු දෙර        ණ
පෙන්වා තමා තෙද අ        ණ
ලක එක හිර වර        ණ
කෙළේ අප හිමි විකුම් අපම        ණ[10]

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

යන මේ රසවත් හරවත් පැදිවලිනි. මෙතුමා වන්නි **පෙදෙස** පාලනය කළ බල සම්පන්න වන්නි රජවරුන් අටළොස් දෙනෙකුන් ද පරාජය කළ බැව් ගිරා සන්දේශයේ සඳහන් වෙයි. විශිෂ්ට ශාසන සංග්‍රහයක් කිරීමට සිතූ මේ රජතුමා අටුවා, ටීකා සහිත ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාගත කෙළේ ය. දිනපතා ම දහම් පොත් ලියූ කතුවරුන්ට ගම්වරයන් ද නොයෙක් ත්‍යාගයන් ද පරිත්‍යාග කෙළේ ය. මේ විස්තරය **පාලි** මහාවංසයෙහි ද සඳහන් වෙයි.[11] ශ්‍රී ලංකාද්වීපයේ රාජාධිරාජයා වූ මෙතුමා කීරවැල්ලෙන් රාජ වංශික කුමාරිකාවක් අගමෙහෙසුන් බවට පත් කර ගත්තේය. රජතුමාට චන්ද්‍රවතී, ලොකනාථා, නම් වූ දුවනිවරු දෙදෙනෙක් ද වූහ. සපුමල් කුමාරයා හා අම්බුලුගල කුමාරයා ද පුත්‍රයන් දෙදෙනෙකුමෙන් දියුණු කෙළේය. තොටගමුවේ ශ්‍රී රාහුල මා හිමිට මේ රජතුමා ස්වකීය පුත්‍රයෙකු ලෙස **සලකා** උපකාර කෙළේය. ස වන පැරකුම්බා රජතුමාගේ රාජ්‍ය කාලය වූ වර්ෂ සත් සැට තුළ පිරිවෙන් අධ්‍යාපනයේ විශේෂ දියුණුවක් ද ඇති විය.

**පිරිවෙන් අධ්‍යාපනය:** :

කෝට්ටේ රාජධානියට ඇතුළත් ප්‍රදේශවල ද, කෝට්ටේ රාජධානියට ආසන්න ප්‍රදේශවල ද අධ්‍යාපන ආයතන පහළ විය. විශේෂයෙන් මේ කාලයේ පිරිවෙන් නමින් අධ්‍යාපන ආයතන නොයෙක් ප්‍රදේශයන් හි බිහි විය. පිරිවෙණ නමින් හඳුන්වන අධ්‍යාපන ආයතනය ආගමික වූ ද භාෂා **ශාස්ත්‍රීය** වූ ද නිදසු අධ්‍යාපන ආයතනයකි. පිරිවෙණ අධ්‍යාපන ආයතනයක් වූයේ කෝට්ටේ යුගයෙන් පසුව යයි සිතමි. කට පාඩම් කිරීම යන අර්ථය ගෙන දෙන පරිවහන ශබ්දය ගැන සිතා මේ අධ්‍යාපන ආයතනයට පිරිවෙණ යන නාමය ව්‍යවහාර කරන්නට වූයේ පශ්චාත් කාලීන විද්වතුන් විසින් යයි සිතමි. පිරිවෙණ නම් මහා විහාරයක් ඇතුළත ප්‍රාකාරාදියෙන් වට කරණ ලද වෙන් වෙන් වශයෙන් පිහිටි භික්ෂූන්ගේ වාසස්ථාන බැව් ''පරිවෙණන්ති මහා විහාර **අබ්භන්තරෙ** විසුං විසුං පාකාරාදි පරිච්ජින්නට්ඨානං''[12] යන මේ පාඨයෙන් ප්‍රකට වෙයි. තවද පිරිවෙණ නම් ඒ ඒ විහාරස්ථානයන් ඇතුළත ප්‍රාකාරාදියෙන් වෙන් වෙන් ව ඇති පරිච්ඡෙද වශයෙන් දක්නට ලැබෙන භික්ෂූන්ගේ වාසස්ථාන බැව් ග්‍රන්ථාන්තරයන්ගෙන් දක්නට ලැබේ. ''පරිවෙණන්ති තස්ස විහාරස්ස අබ්භන්තරෙ විසුං විසුං පාකාරාදි පරිච්ඡන්නට්ඨානං පරිච්ඡෙද වසෙන වෙදියනි.‹දස්සයතෙති පරිවෙණං තං භික්ඛුනං වසනට්ඨානං[13] යන පාඨයෙන් මෙහි සඳහන් කළ අදහස ප්‍රකට වෙයි. භික්ෂූන් වහන්සේලාගේ පෞද්ගලික වාසස්ථානයද, ආචාර්‍ය උපාධ්‍යායන්ගේ වාසස්ථානය ද පිරිවෙණ නමින් හඳුන්වා ඇති බැව් ''අත්තනො පරිවෙණන්ති ඉමිනාපි තස්සෙව පුග්ගලික සෙනාසනං වුත්තං'' ''අත්තනො පරිවෙණන්ති ඉමිනා **ආචරියුපජ්ඣායානං** වසනට්ඨානං දස්සිතං''[14] යනාදී පාඨවලින් ද ප්‍රකට වෙයි. **සංස්කෘත** පරි—වෙණ ධාතුව ගති. ඥාන. චින්තා. ග්‍රහණ යනාදී අර්ථයන් හි වැටේ.

මේ අනුව හාත් පසින් ම නුවණ දියුණු කර ගැණිමට චිත්ත ශක්තිය දියුණු කර ගැණීමට අධ්‍යයනය කරණ ස්ථානය පිරිවෙණ නාමයෙන් ප්‍රකට කළ හැකි වෙයි. සංස්කෘත ශබ්ද කෝෂ ග්‍රන්ථයන් හි පරිවෙණ ශබ්දයක් දක්නට ලැබෙන්නේ විරල වශයෙනි. එහෙත් පාලි සංස්කෘත භාෂා ද්වයට ම තත්සම ශබ්දයක් වශයෙන් මේ පරිවෙණ ශබ්දය බොහෝ උගත්හු භාවිත කරති. සිංහල සාහිත්‍ය ග්‍රන්ථයන් හි ද, පිරිවෙණ හඳුන්වා ඇත්තේ **භික්ෂූන්ගේ** වාසස්ථාන වලට බැව් '' තිස් මහ වෙහෙර සල්වස''පිරිවෙණ''යයි[15] හා ''ලැගුම් ගෙයි සතප්වා ලෙඩ බලන සේක්'' යන වැකියෙන් ද ප්‍රකට වෙයි. එද බුදුරජාණන් **වහන්සේ** වැඩ වාසය කර වදළ ගඳ කිළියද

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

පිරිවෙණ නාමයෙන් **හඳුන්වා** ඇති බැව් සිංහල උම්මග්ග ජාතකයෙහි දක්නට ලැබෙන "ධම් සභා මණ්ඩපයෙහි උපන් කථා ස්වරූපය ගඳකිළි[16] පිරිවෙණෙහි වැඩ හුන් සේක් දිව කණින් අසා වදරා" යනාදී වාක්‍යයෙහි යෙදී ඇති ගඳකිළි පිරිවෙණෙහි යන වචන යෙන් පෙණේ. පරිවෙණ ශබ්දය භික්ෂූන් වහන්සේලා වාසය කරණ ආරාමයන් සඳහා පාලි සාහිත්‍ය ග්‍රන්ථයන් හි ද යොදා ඇති බැව් "සංඝමජ්ඣං, ඔතරිත්වා වසං ධුර පරිවෙණ තාල නාලිකෙර ආදීනි ආරොපෙත්වා" යන පාඨයෙන් හෙළි වෙයි. ප්‍රාසාදවලට ද වඩා ප්‍රමාණයෙන් විශාල වූ සංඝාවාස වලට ද පරිවෙණ යන වචනය යොදා ඇති බැව් "අන්තො ගබ්භ පමුඛ පාසාද පරිවෙණ[17] සංඝාරාම" යනාදී පාඨයෙන් ප්‍රකට වෙයි. භික්ෂූන් වහන්සේගේ කාමරය හෝ පෞද්ගලිකකාර්‍යාලය ද පිරිවෙණ නාමයෙන් හඳුන්වා ඇති බැව් කිවයුතුය. මිහිඳු හිමියන්ගේ කාලයෙහි පිරිවෙණ නාමයෙන් ව්‍යවහාර කළ හැම ස්ථානයක් ම භික්ෂූන්ගේ වාසස්ථානයක් වූ හයි කිව යුතුය. දෙවන පෑතිස් රජතුමා විසින් ප්‍රථමයෙන් ම මිහිඳු හිමියන් ට තිස්සාරාම යෙහි කරවන ලද පිරිවෙණ කාල ප්‍රසාද පිරිවෙණ නමින් ප්‍රසිද්ධ විය. එයින් පසු අනුරාධපුර යුගයටත් කෝට්ටේ යුගයටත් අතර ඇති වූ පිරිවෙන් නමින් හැඳින් වූ ස්ථාන රාශියක නම් මහා වංශයෙහි සඳහන් වෙයි.

**කෝට්ටෙ යුගයේ පිරිවෙන් හා අධ්‍යාපනය:** :

ජයවර්ධන පුර කෝට්ටෙ රාජධානිය වශයෙන් තබාගෙණ සකල ලංකාද්වීපය එකච්ඡත්‍ර කොට රාජ්‍යය කළ සවන සිරි පැරකුම්බා රජතුමාගේ කාලයේ ලංකාවේ අධ්‍යාපන තත්වය විශේෂයෙන් දියුණු විය. පිරිවෙන් නම් වූ භික්ෂූන් වහන්සේලාගේ ආශ්‍රමයන් හි පැවති ඉගැන්වීම පිරිවෙන් අධ්‍යාපනය වශයෙන් හඳුන්වනු ලැබේ. අධි පූර්ව ඉණ් ධාතුවෙන් සිද්ධවෙන අධ්‍යාපන ශබ්දයෙන් වාච්‍ය වන්නේ ඉගැන්වීමයි. ඉගෙණිම අධ්‍යයන නම් වෙයි. පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රභාස්වර යුගය කෝට්ටෙ යුගය වශයෙන් සලකති. මේ යුගයේ ලක්දිව හැම තැනම ශාස්ත්‍රලෝකය පතුරුවා සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත, **අපභ්‍රංස**, මාගධී, පෛශාචි, ශෞරසෙනි, තර්ක, ව්‍යාකරණ ඡන්දස්, කාව්‍ය, නාටක, ඉතිහාස, පුරාවිද්‍යා ආදි විවිධ විෂයයන් ඉගැන්වූ භික්ෂූන් වහන්සේලාගේ ආරාමයන් හි පැවති අධ්‍යාපනය පිරිවෙන් අධ්‍යාපනයයි. කෝට්ටෙ යුගයේ මේ ශ්‍රෙෂ්ඨ අධ්‍යාපනය දහස් ගණන් ගිහි පැවිදි ශිෂ්‍යයන්ට බෙදා දුන් ශ්‍රෙෂ්ඨ පිරිවෙන් රාශියක් වූ බැව් ඉතිහාසයේ සඳහන් වෙයි. ඒ පිරිවෙන් අතුරෙන් විශිෂ්ට තත්වයේ පැවැති පිරිවෙන් කීපයක් පිළිබඳව කෙටි විස්තරයක් කිරීමට බලාපොරොත්තු වන්නෙමි.

1. කැරගල පද්මාවතී පිරිවෙණ
2. වීදගම සිරි ඝනානන්ද පිවෙණ
3. තොටගමුවේ **විජයබාහු** පිරිවෙණ
4. දෙවිනුවර තිලක පිරිවෙණ
5. පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙණ

**මෙ පිරිවෙන් ඒ කාලයේ උසස් තත්ත්වයෙන් පැවැති විද්‍යායතනයන්**[18] වශයෙන් සලකති.

මේ පිරිවෙන් **කෝට්ටෙ** යුගයට අයත් නමුත් මෙයින් එක් පිරිවෙණක් වත් කෝට්ටේ රාජධානියට අයත් නොවේ. කෝට්ටෙ එරබත්තොට තිබුණ බැව් කියන

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ධර්මරාජ පිරිවෙණ ය වන පැරකුම්බා රජතුමාගෙන් පසු කාලයක වූ පිරිවෙණක් බැව් කිව යුතුය. ගතාරා පිරිවෙණ, පඬි පිරිවෙණ සප්තරාජ පිරිවෙණ ද ඒ කාලයේ පැවැති පිරිවෙන් කීපයකි. එහෙත් ඒ පිරිවෙන් නාම මාත්‍ර වශයෙන් පැවති බැව් සැලකිය හැකිය.

1. කැරගල පද්මාවතී පිරිවෙණ :

මේ පිරිවෙණ කෝට්ටේ යුගයේ ක්‍රියාත්මක වූ ශ්‍රේෂ්ඨ විද්‍යායතනයකි. කැරගල පද්මාවතී පරිවෙණාධිපති කැරගල වනරතන මා හිමියන් නිසා මේ පිරිවෙණ තත් කාලීන ශ්‍රේෂ්ඨතම විද්‍යායතනයක් වශයෙන් කීර්තියට පත් විය. වීදගම මෛත්‍රෙය මා හිමියන් විසින් කැරගල වනරතන මා හිමියන් වෙත යවන ලද හංස සංදේශයෙහි කැරගල පද්මාවතී පිරිවෙණ ගැණත්, වනරතන මා හිමියන් ගැනත් විශේෂ වැණුම් ඇතුළත් වී ඇත. කැරගල පද්මාවතී පිරිවෙණ විශ්ව කීර්තියට පත් වූයේ හංස සංදේශය නියා යයි කිව හොත් එය පරිපූර්ණ සත්‍යයකි. රතන සූත්‍රය ලක්ෂවාරයක් කියා දෙවියන්ට පින් දී පැරකුම්බා රජතුමා ආරක්ෂාකර දෙවියන්ට යාඥා කරණ ලෙස වීදගම මෛත්‍රෙය හිමියන් විසින් පද්‍ය දෙසියයකින් පරිමිත කොට වනරතන හිමියන්ට හංසයකු ලවා යවන ලද සංදේශය හංස සංදේශයයි. මේ සංදේශයෙහි කැරගල පද්මාවතී පිරිවෙන් වැණුමේ දැක්වෙන,

මඳකුත් පවර පෙර'දුරු උවදෙස් නොහැර
දූනගත් ගැඹුරු පද පදරුත් නියම කර
පැණවත් පසිඳු පඬිවරු ඉඳ වෙහෙර තුර
පවසත් නොයෙක් තකු වියරණ සඳ ලකර[19]

යන මේ රසවත් හරවත් කවියෙන් එද කැරගල පද්මාවතී පිරිවෙණේ පැවැති තත්වය ප්‍රකට වෙයි. පෙර භාරතයේ පැවැති නාලන්ද **තක්ෂලා** ආදී විශ්ව විද්‍යාල යන් ගේ තත්ත්වය මේ පිරිවෙණේ ද පැවැති බැව් මේ කවියෙහි ඇතුළත් ''පැණවත් පසිඳු පඬිවරු ඉඳ වෙහෙර තුර — පවසත් නොයෙක් සකු වියරණ සඳලකර'' යන පද්‍යාර්ධයෙන් ප්‍රකට කළ හැකිය.

විද්‍යායතනයක් බහු ජන සම්මානයට පාත්‍ර වන්නේ ආයතනාධිපතිවරයාගේ දක්ෂ භාවයත් විචක්ෂණ භාවයත් ගුණ වෘද්ධත්වයත් ඥන වෘද්ධත්වයත් බහුජන ප්‍රසාදයත් අනගතිගාමීත්වයත් නිසා බැව් පිළිගත් සිද්ධාන්තයකි. මේ අනුව කැරගල වනරතන හිමියෝ මේ සියලු නෙත්‍ර ගුණවලින් යුක්ත වූ බව ද උන් වහන්සේ ගේ ගුණ බැණිමට අනන්ත නාගරාජයා හැර අන් කිසිවෙක් සමත් නොවන බැව්ද හංස සන්දේශයෙහි දැක්වෙන —

පත් සතතහු මෙත් සිතැතහු කිත් කොත හු
දෙත් සමතහු ලත් සැපතහු සත් සිත හු
ගත් සමත හු සත් සිරිනහු සෙත් පත හු
නත් සතතහු මුත් කෙවතහු වණත් ඔ හු[20]

යන මේ ඔජො රස පූර්ණ පද්‍යයෙන් ප්‍රකට වෙයි. කැරගල පද්මාවතී පිරිවෙණ මේ ශ්‍රේෂ්ඨ අධිපතීන් වහන්සේගෙන් සනාථ විය. කැරගල පද්මාවතී විහාරය

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

දලගක්කෝනාර නම් ප්‍රභූවරයකුගේ සොහොවුරිය වූ පද්මාවතී කුමරියගේ වැඳුම් පිදුම් සඳහා අර්ථ නායක හා දළසෙන් ගමු නම් ඇමතිවරුන් දෙදෙනා විසින් කරවන ලද බැව් "සිරිසඟබෝ ශ්‍රී විජයබාහු මහ රජාණන්ට එකොළොස් වැන්නේ දී අත්ථ නායක දලසෙන් ගමු (මන්ත්‍රීවරුන්) තමන් ලහ උන් දලගක්කෝණාර පාදයාගේ සහෝදර බුහුනනියන් පද්මාවතීන් වැඳ පුද ගන්නා ලෙසට කර වූ කැරගල විහාර සන්නක" යනාදී වශයෙන් දක්වෙන කැරගල[21] සන්නසෙහි සඳහන් වෙයි. මේ කැරගල විහාරය තුදුස්වන සියවස අවසානයෙහි හෝ පසළොස් වන සියවසෙහි ආරම්භයේ දී ආරම්භ වන්නට ඇතැයි, විචාරකයෝ කල්පනා කරති. කැරගල විහාරස්ථානයේ චිරස්ථිතිය පිණිස ස වන සිරි පැරකුම්බා රජු ස්වකීය එකොළොස් වන වර්ෂයේ දී ගම් බිම් පරිත්‍යාග කළ බැව් කැරගල සන්නසක සඳහන් වෙයි.

ස වන සිරි පැරකුම්බා රජතුමා ගේ කාලයෙහි කැරගල වනරතන මා හිමියන්ගේ ආධිපත්‍යය යටතේ කැරගල පද්මාවතී පිරිවෙණ ශාස්ත්‍රාලෝකයෙන් ලක්දිව ආලෝක කරමින් දියුණු වී පැවති සැටි හංස සන්දේශයෙහි සඳහන් වෙයි.

එයින් කවි කීපයක් සුධී ජනයාගේ පහන් සංවේගය දනවීම සඳහා මෙහි සඳහන් කරමි.

සරණ වැද ගුරුන් කියවා දිනෙත්    දින
පරණ අලුත් පොත් පෙරළා පණින්    පන
දරණ කරණ ලෙස ඉඳගෙන වෙනින්    වෙන
හෙරණ සික කියති හෙරණෝ තැනින්    තැන

මෙන් සක කිරණ පිරිසිදු කර සිල්    ගුණය
ඉන් සැක නොවී කරුණුව සසර තං    ණය
නන් සික පද නිබඳ රකිනා ලෙස    පණය
මුන් සික සික වළඳ විමසන සඟ    ගණය

එසමන් බදුරු මුනි සදහම් පෙළෙහි    ඇති
ලෙස සත් සඳ සමස් ඇ දනුමට    පැවැති
අසමින් නැස ටීකා විනිස සැක    නැතී
කසයින් විරිත සමහරු වන පොත්    කරතී

සොඳුරු පොරණ ඇඳුරොල් නොහැර පිවිතු    රූ
විදුරු නැණින් පිරිසිඳ දුරැර මොහඳු    රූ
මියුරු බසින් සැක හැර දෙසන විසිතු    රූ
ගැඹුරු විජම් පෙළරුත් අසති සමහ    රූ

මදක් ඇසුව සිදුවන සග මොක් කැමැ    ති
නොයෙක් රහත් මොක් සිදුනොකොට නොනැව    තී
උදක් දෙසැට මිස දිටු මුල් සිඳ    පැවැ ති
අයෙක් සුතුරු පෙළදම් පදරුත්    අස ති

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

පැවැති සියල් ටීකා ගැට පද දීක ය
විමති නොවී මඳකුත් එක ද තැන ක ය
කැමති ලෙසින් පවසන හැර සිත සැක ය
අසති නොයෙක් සහ ගණ විනය පිටක ය

මඳකුත් පවර පෙර'දුරු ළව දෙස් නො හැ ර
දූනගත් ගැඹුරු පද පදරුත් නියම ක ර
පැණවත් පසිඳු පඬිවරු ඉඳ වෙහෙර තු ර
පවසත් නොයෙක් සකු වියරණ සඳ ලක ර

අශේසදෙස පරසිඳු පොරණ පඬි ඞි වර
විසේසයෙන් පැවසූ නොයෙක මන හර
දොසේ දුරලමිනි සඳ වියරණ ල කර
ඇසේ කියන විසිතුරු කව් නළු ස ස තර[22]

මේ වීදගම මා හිමියන් විසින් රචිත සාරවත් සාටෝප පද ලාලිත්‍යයකින් යුත් රමණිය කැරගල පිරිවෙන් වැණුමකි. කැරගල පද්මාවතී පිරිවෙණ කෝට්ටෙ යුගයේ පැවැති ශ්‍රේෂ්ඨ අධ්‍යාපන ආයතනයකි. එය පිරිවෙන් අධ්‍යාපන පීඨයකි. එහි අධිපතීන් වහන්සේ ගුණ නුවණ දෙකින් පිරිපුන් කැරගල වනරතන මා හිමියෝ වෙති. මුන් වහන්සේ විශ්ව කීර්තිමත් මහා පඬිවරයාණ කෙනෙකි. උන්වහන්සේ නුවණින් සුරගුරුට හැර අනිත් කිසිවකුට දෙවෙනි නොවෙති. මෙ හිමියන්ගේ වචන ඡන්දස් අලංකාරයන්ගේ උත්පත්ති ස්ථානයයි. මේ අදහස් හංස සන්දේශ කතුවරයා පවසන්නේ,

කිම ඔහු යස වෙන වෙන අප කියනු දූනී
ඇති තනු ලෙස සව් සතර ම දත් බැවි නී
සුරගුරු මිස නොකෙරෙයි කෙනෙකුන් දෙවැ නී
එයතිඳු බස සඳ ලකරණ උපන් තැ නී[23]

කැරගල පද්මාවතී පිරිවෙණ සූත්‍ර අභිධර්ම, විනය ද යන ත්‍රිපිටක ධර්මය තර්ක ව්‍යාකරණාදිය ඉගැන් වූ තත් කාලීන කීර්තිමත් පිරිවෙණක් විය.

2. තොටගමුවේ සිරි විජයබාහු පිරිවෙණ :

තොටගමුවේ සිරි විජයබාහු පිරිවෙණ කෝට්ටේ යුගය ධර්ම ශාස්ත්‍රාලෝකයෙන් ප්‍රභාස්වරයට පත් කළ ප්‍රධාන ම පිරිවෙන් ආයතනය වශයෙන් සඳහන් කළ යුතුය.

ලංකාවේ දක්ෂිණ දිශා භාගයෙහි තොටගමුව නම් සුප්‍රසිද්ධ ග්‍රාම වරයක් වෙයි. ඒ තොටගමු ගමෙහි වූ පැරණි විහාරස්ථානය තොටගමු විහාරයයි. මේ තොටගමු විහාරයෙහි මහා විජයබාහු රජතුමා විසින් ආරම්භ කරණ ලද පිරිවෙණ විජයබාහු පිරිවෙණ නමින් හඳුන්වන ලදී.

විජයබාහු පිරිවෙණ ආරම්භ කරණ ලද්දේ කෝට්ටේ යුගයේ නොවේ. කුරුණෑ ගල යුගයේ විසූ මහා විජයබාහු නොහොත් විජයබාහු රජතුමා විසිනි. ඒ බව තොට ගමු වෙහෙර පිළිබඳව මහාවංසයෙහි මෙසේ සඳහන් වෙයි.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

1. තිත්ථ ගාම විහාරස්මිං — මහා විජය බාහුනා
යත්ථ කාරාපිතො පඤ්ච — තාළීස රතනායතො
2. පරිජිණ්ණො අහු දීඝ — පාසාදො තත්ථ සො පුන
පරක්කමභුජො රාජා — තිංස හත්ථායතං සුභං
3. ද්විභූමං දීඝ පාසාදං — තුංග සිංග සමායුතං
කාරාපෙත්වාන තං නානා — චිත්ත කම්මන්ත භාසුරං
4. තද විජය බාහව්හ — පරිවෙණාධිවාසිනො
කාය සත්ථි මහාථෙරෙ — භදන්තස්ස සමප්පයි
5. උපගිම්භ නදී තීරං — සාලග්ගාමාභිධානකං
ගාම මෙකඤ්ච දපෙසි — කත්වා තම්පරිවෙණිකං
6. යුත්තං පංච සහස්සෙහි — නාළිකෙර තරූහිසො
ආරාමං කාරයී තත්ථ — තිත්ථ ගාමෙ මනොරමෙ[24]

පාලි මහාවංසයෙහි දක්වෙන මේ ගාථාවන්ගෙන් විජයබාහු පිරිවෙණේ අතීතය හෙළි වෙයි.

තොටගමු විහාරයෙහි මහා විජයබාහු මහ රජතුමා විසින් කරවන ලද සතළිස් පස් රියනක් පමණ දික් වූ දීර්ඝ ප්‍රාසාදය දිරාගොස් තිබුණේය. එහි නැවතත් සිව්වන පැරකුම්බා රජු විසින් තිස් රියනක් දික් වූ අලංකාර දෙමහල් මනදිරයක් සාදවන ලදී. එය වියජබාහු පරිවෙණාධිවාසී කාය සත්ථි මහ තෙරුන්ට පිළිගන්වන ලදී. ගිං ගඟ සමීපයෙහි වූ සල්ගම ද පිරිවෙණ ට පූජා කරණ ලදී. තවද තොටගමුවෙහි ඒ රජතුමා විසින් පොල්ගස් පන්සියයකින් යුත් ආරාමයක්ද කරවණ ලදී. මේ අනුව විජයබාහු පිරිවෙණ කුරුණෑගල යුගයට අයත් බැව් කිව යුතුය. එද එහි අධිපති හිමිතුමා කාය සත්ථි නම් විය. කායසත්ථි මහ තෙරුන්ගෙන් පසු ව විජයබාහු පරිවෙණාධිපති ධුරයට ගලතුරුමූල මහා ස්වාමීන්ද්‍රයෝ පත් වූහ. එයින් පසු උත්තර මූල මහා ස්වාමීන්ද්‍රයෝ පරිවෙණාධිපති ධුරයට පත් වූහ. එයින් පසු කෝට්ටේ යුගයේ දී තොටගමුවේ ශ්‍රී රාහුල ස්වාමීන්ද්‍රයෝ විජයබාහු පරිවෙණාධිපති ධුරයට පත් වූහ. ශ්‍රී රාහුල මා හිමියන් පරිවෙණාධිපති ධුරයට පත්වීමෙන් පසු තොටගමුවේ ශ්‍රී විජයබාහු පිරිවෙණ විශ්ව කීර්තියට පත් ශ්‍රෙෂ්ඨ පිරිවෙණක් විය. නොයෙක් සන්දේශ කාව්‍යයන් හි තොටගමුවේ විජයබාහු පිරිවෙණ පිළිබඳවත් ශ්‍රී රාහුල ස්වාමීන්ද්‍රයන් පිළිබඳවත් වැණුම් දක්නට ලැබේ. කෝකිල සන්දේශයෙහි තොටගමු විහාරය ගැණ ද දාගැබ ගැන ද ප්‍රතිමාව ගැණ ද විස්තර සඳහන් වෙයි. එහෙත් පිරිවෙණ පිළිබඳව විස්තරයක් එහි සඳහන් නොවේ. කෝට්ටේ යුගයෙන් පෙර රචනා කරණ ලදැයි සළකන මයුර සන්දේශයෙහි තොටගමුව ගැණ සඳහන් ව ඇතත් විජයබා පිරිවෙණ ගැණ කිසිවක් සඳහන් වී නැත. කෝට්ටේ යුගයේ විසූ ප්‍රතිභාපූර්ණ කවිත්වයකින් යුත් ස්වකීය නාමය ප්‍රකට කිරීමට නොකැමැති වූ කිසියම් පැවිදි කිවි වරයෙකු විසින් විරචිත ගිරා සන්දේශයෙහි විජයබා පිරිවෙණ පිළිබඳව තාත්වික වැණුමක් ඇතුළත් වෙයි. එහි සිරි රහල් හිමියන් පිළිබඳ වූ ද, එද පිරිවෙණ පැවැති උසස් තත්වය පිළිබඳ වූ ද, පිරිවෙණේ ඉගැන් වූ විෂයයන් පිළිබඳ වූ ද, ශිෂ්‍යයන් පිළිබඳ වූ ද, කාව්‍යමය වර්ණනාවක් ඇතුළත් වෙයි. ගිරා සන්දේශ කතුවරයා විජයබා පිරිවෙණෙහි තත්වය මූර්තිමත් කර දක්වන රමණීය පද්‍ය කීපයක් මෙහිලා ගෙණහැර දක්වමි.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

1 මනරම් වෙහෙර තුළ තැන තැන සපැමිණ ය
සිතියම් බණ වසුන් විදහා අපමණ ය
සිත සොම් නසින් සිහි කරැ කරැ බුදු ගුණ ය
අබිදම් පෙළ අරුත් විමසන සහ ගණ ය

2. උතුරු ගුණෙන් සපැමිණ පිළිවෙත් මග ය
පතුරු වමින් සත වෙත මෙත් මහ ගහ ය
අතුරු දහන් කෙරෙමින් සිවු අව මහ ය
සුතුරු දහම් පවසන සමහා සහ ය

3. සමහර සුපිළිපත් සහ ගණ මන මෙන ය
පුවතර අරුත් ටීකා ගෙණ වෙන වෙන ය
පැණසර ඇදුරු උවදෙස් බස් දැන ගෙන ය
නොමහැර ගැඹුරු තැන් විමසති විනය න ය

4. මුනිවර දෙසූ සදහම් මෙන් ඇම දවස
උවදුරු දුරැර රකිනුව සත් වග වෙසෙස
පෙරැදුරු ඉසිවරන් පැවසූ නොයෙක ලෙස
වෙදවරු වෙද සතර පිරුවති එහි සනොය

5. සිරිමත් සොඳුරු එවෙහෙර තැන තැන ලකුළු
ඉදිසිත් ලෙසට පෙර කිවියර සිරි රැකුළු
දැනගත් සඳ ලකර වියරණ වියත් මුළු
පවසත් සකු මග ද එළු දෙමළ කවි නළු[25]

ගිරා සන්දේශයෙහි ඇතුළත් මේ විජයබා පිරිවෙන් වැණුම අනුව විජයබාහු පිරිවෙණ කෝට්ටේ යුගයේ පැවැති ශ්‍රේෂ්ඨතම පිරිවෙන් අධ්‍යාපනික ශාස්ත්‍ර පීඨය බැව් කිව යුතුය. මේ විජයබාහු පිරිවෙණෙහි අධ්‍යයනය කළ ශිෂ්‍යයෝ ත්‍රිපිටකය, ව්‍යාකරණ, සිංහල පාලි, සංස්කෘත ප්‍රාකෘත දෙමළ භාෂාවන් ද කාව්‍ය නාටකයන් ද වේදය අර්ථ ශාස්ත්‍රය ආදී ශාස්ත්‍රයන් ද මැනැවින් හැදෑරීම කළහ. ශ්‍රී රාම චන්ද්‍ර භාරතී නම් පඬිවරයා ආදී විදේශ ශිෂ්‍යයෝ ද මේ පිරිවෙණේ සතුටින් ඉගෙණ ගත්හ.

එද විජයබාහු පරිවෙණාධිපති ධුරය දැරූ ෂඩ් භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල සංඝරාජයන් වහන්සේ පසළොස්වන වියේ දී කඳ කුමරුගෙන් වරය ලැබූ අසම සම පඬිවරයාණෝ වූහ. කාව්‍ය චක්‍රවර්තිවරයාණෝ වූහ. ස වන සිරි පැරකුම්බා රජුගේ පුත්‍රයෙකු ලෙසින් වැඩුණු මෙතුමා දෙමටාන කඳවුරු කුලෙහි උපන් උතුරුමූළ මහ තෙරුන්ගේ මුනුබුරෙකි. මහ වීදගම තෙරුන්ගේ ශිෂ්‍යයෙකු වශයෙන් පැවිදි වී උන්වහන්සේගෙන් ම ඉගෙණ, සංස්කෘත, මාගධි, ප්‍රාකෘත, ශෞරසේනී, පෛශාචි, අපභ්‍රංස යන ෂඩ් භාෂාවන්ගේ පරමේශ්වරත්වයට පත් වූ බවද රාජගුරු පදවියට පත් වූ බව ද සංඝරාජ පදවියට පත් වූ බවද වාගීශ්වරත්වය ලැබූ බව ද[26] ග්‍රන්ථාන්තරයන් හි සඳහන් වෙයි. මුන් වහන්සේ විසින් පරෙවි අස්න, සැළලිහිණි අස්න, කව්සේකරය, පංචිකා ප්‍රදීපය හා බුද්ධිප්පසාදිනී ටීකාව ද රචනා කරණ ලදී.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ශ්‍රී රාහුල මා හිමියන්ගේ ආධිපත්‍යය නිසා තොටගමුවේ විජයබා පිරිවෙණ විශ්ව කීර්තියක් ලැබූ තත්කාලීන පාරිවෙණික අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් විය.

3. විදගම සිරි සනානන්ද පිරිවෙණ :

කෝට්ටේ යුගයට අයත් ශ්‍රේෂ්ඨ අධ්‍යාපන ආයතනයක් වූ ශ්‍රී සනානන්ද පිරිවෙණ ආරම්භ කරණ ලද්දේ කුරුණෑගල රාජ්‍යය කළ පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා විසිනි. රයිගම සමීපයෙහි වූ විදගම සිරි සනානන්ද පරිවෙණස්ථානයෙහි බෝධිය හා පිළිම ගෙවලින් ද යුත් විහාරයක් කර වූ රජතුමා එය සොළී රටින් මෙහි පැමිණ සිටි රජතුමාගේ ආචාර්ය වරයෙකු වූ මහ තෙර නමකට පූජා කළ බැව් මහාවංශයෙහි දක්වෙන,

සුභෙ විද්දුම ගාමස්මිං රාජග්ගාම පුරත්තිකෙ<br>
වරං සිරිං සනානන්දං පරිවෙණං සමායුතං<br>
විහාරං කාරයිත්වාන සම්බොධි පටිමා ඝරං<br>
උත්තනො ගරු චොළීස මහාථෙරස්ස දපයි[27]

යන ගාථාවන්ගෙන් ප්‍රකට වෙයි. ජයවර්ධන පුර කෝට්ටේ නගරයට ආසන්න වූ රයිගම සමීපයෙහි වූ විදගම මහා විහාරයෙහි වූ ශ්‍රී සනානන්ද පිරිවෙණ ද කෝට්ටේ යුගයට අයත් වූ ප්‍රසිද්ධ පිරිවෙන් විද්‍යාපීඨයකි. ඒ කාලයේ විදගම ධර්ම ශාස්ත්‍රීය කටයුතු වලින් ප්‍රසිද්ධියට පත් වූ ගම්මානයකි. සවන සිරි පැරකුම්බා රජතුමාට රාජ්‍යය ලබා දීමට ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කළ මහා විදගම හිමියන්ගේ ද ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයන් කීපයක් රචනා කිරීමෙන් බහුශ්‍රැත පඬිවරයෙකු වශයෙන් ප්‍රසිද්ධ ව විසූ දෙවන විදගම හිමියන්ගේ ද ජන්ම භූමිය විදගම නම් සුප්‍රසිද්ධ ග්‍රාමයයි. මහා විදගම හිමියෝ ප්‍රථමයෙන් මේ විදගම විහාරස්ථ සනානන්ද පිරිවෙණෙහි ආධිපත්‍යය දැරූහ. උන්වහන්සේගෙන් පසුව බුද්ධිමත් පඬිවරයෙක් වූ දෙවන විදගම යති තුමා විහාරාධිපතිත්වයට පත්විය. මුන් වහන්සේලා සිරි සනානන්ද පරිවෙණාධිපතින් වහන්සේලා ද වූහ.

සතරවන පණ්ඩිත පරාක්‍රම බාහු රජතුමාගේ කාලයෙහි ද ජාතක පොත සිංහලට පරිවර්තනය කිරීමාදි වශයෙන් ධර්ම ශාස්ත්‍රීය සේවාවන්ට ආධාර ස්ථානයක් වූ මේ සනානන්ද පිරිවෙණ කෝට්ටේ යුගයේ ප්‍රසිද්ධ පිරිවෙණක් වශයෙන් පැවැති බැව් කිව යුතුය. එහෙත් කෝට්ටේ යුගයේ විසූ කවියන්ගේ වැණුමට මේ සනානන්ද පිරිවෙණ ලක් වී නැත. සනානන්ද පිරිවෙණෙහි වැඩ වසමින් ග්‍රන්ථයන් රචනා කළ දෙවන විදගම හිමියෝද සනානන්ද පිරිවෙණ ගැන සඳහන් නොකළහ. තුදුස් වන සිය වසේ අවසාන භාගයෙහි විසූ කවීශ්වර පඬිවරයන් විසින් විරචිත මයුර සන්දේශයෙහිද සඳහන් කරණ ලද්දේ විදගම වෙහෙර පමණකි. පිරිවෙණක් ගැණ එතුමා විසින් ද කිසි ම සඳහනක් නොකරණ ලද බැව්

සිතු පාද සත නොළද නද                    වන<br>
නොම බාද වන සමුද යොද                    ගෙන<br>
කළ පුද පින් පලද උද                    වන<br>
වඳ විද ගම මනිඳා උද                    යන[28]

යන මේ කවියෙන් පෙනේ. යත්වයන් විසින් ශ්‍රද්ධාවෙන් විශාල ධනයක් පරිත්‍යාග කරණු ලැබූ ඒ පූජාවෙහි ප්‍රතිඵල ප්‍රකාශ වන විදගම විහාරයෙහි වැඩ වාසය

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

කරණ පිළිම වහන්සේට නමස්කාර කිරීමට කවියා මොනරාට කියයි. සිරි සනා
නන්ද පිරිවෙණ ගැන මෙහි සඳහන් වී නැත. මේ හිමියන් විසින් රචනා කරණ ල
ලෝ වැඩ සඟරාවෙහි ද සඳහන් වී ඇත්තේ

‘‘වීදගම වෙහෙරෙ හි මෙත් තෙරි ඳු සඳ’’

යනුවෙන් විහාරයෙහි නාමය පමණක් බැව් පෙනේ. එහි ද පිරිවෙණ පිළිබඳ සට
හනක් නැත. බුදුගුණ අලංකාරය ද වීදගම හිමියන් ගේ කෘතියකි. බුදු ගුණ අලංකාර
යෙහි ද පිරිවෙණ පිළිබඳ ව සඳහනක් කර නැත.

මුන් වහන්සේගේ ප්‍රශස්ත කාව්‍ය ග්‍රන්ථයක් වන හංස සන්දේශයෙහි කැරගල
පද්මාවතී පිරිවෙණ ගැණ විසිතුරු වැණුමක් කර ඇතත් තමන් වාසය කරණ ශ්‍රී සනා
නන්ද පිරිවෙණ පිළිබඳව එතුමෝ කිසිම සඳහනක් නොකරති. එහෙත් කෝට්ටේ
යුගයේ පැවැති උසස් පිරිවෙන් අතුරෙන් සනානන්ද පිරිවෙණ ද තත්කාලීන ප්‍රසිද්ධ
විද්‍යා ස්ථානයක් වූ බවට සැකයක් නැත. සැකයක් වෙතොත් එය පිරිවෙණේ වාසි
යට හේතු වේවා යනු මගේ පැතුමයි. වීදගම ශ්‍රී සනානන්ද පරිවෙණාධිපති වීදගම
හිමියන් දේවත්වය පවා නො පිළිගත් භෞතික කටයුතු ද ගරුත්වයෙන් නො සැළකූ
හිමි නමක් වූ හෙයින් එතුමන් ස්වකීය විහාරස්ථානය සිය ගණනක් ගිහි පැවිදි ශිෂ්‍ය
යන් ගේ අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වූ බැව් ප්‍රකට කිරීමට නොකැමැති වූහයි සිතමි.
ස වන පැරකුම්බා රජතුමා ද සිරි රහල් මා හිමියන් ද සනානන්ද පිරිවෙණේ ආදි ශිෂ්‍ය
යන් වූ හයි කියන්නෝ ද වෙත්. ලෝ වැඩ සඟරාව, බුදුගුණාලංකාරය, දහම් ගැට
මාලාව, කව් ලකුණු මිණි මල වැනි විද්වතුන් ගේ සම්මානයට පාත්‍ර වූ ග්‍රන්ථයන්
රචනා කළ මහ නෙත් පාමුල වීදගම මෛත්‍රෙය හිමියන් වැනි මහතෙර වරුන්ගේ
වාස භූමිය වූ වීදගම ශ්‍රී සනානන්ද පිරිවෙණ ද එකල උසස් විද්‍යා ස්ථානයක් ලෙස
පවතින්නට ඇතැයි මම විතර්කණය කරමි.

4. දෙවිනුවර තිලක පිරිවෙණ :

දෙවිනුවර තිලක පිරිවෙණ ද කෝට්ටේ යුගයේ පැවැති විද්‍යා ස්ථානයකි. දෙවි
නුවර ඉතා ම ප්‍රසිද්ධ ග්‍රාමයකි. දෙවියන්ගේ නුවර යන අර්ථයෙන් දෙවිනුවර යැයි
කියනු ලැබේ. උත්පල වර්ණ දිව්‍ය රාජයා අරක්ගත් දේවාලයක් ඇති හෙයින් මේ
නගරය දෙවි නුවර නම් වී යයි කියති. දෙවිනුවර යන නාමයම දෙවුන්දර නමින්
ව්‍යවහාර කරණු ලැබේ. මේ උත්පල වර්ණ දිව්‍යරාජයා බුදු රජාණන් වහන්සේ බුදුවන
අවස්ථාවෙහි වජ්‍රාසනය සමීපයට පැමිණි වසවත් මරු සහිත සේනාවට භය නොවී
ස්වකීය දුන්න ද රැගෙණ වජ්‍රාසනය සමීපයේම බුදුරදුන්ගේ ආරක්ෂාවට සිටි බැව්

අමා ඇඳුරු උන් සඳ විදුරසුන් ම තු
පමා නොවී පැමිණෙන යුදට වස ව තු
තමා ම සැව් බල පෑ සිටි නොබා සි තු
මෙමා වණනු කිම මොහු තෙද බල අමු තු[29]

යන මේ කෝකිල සන්දේශාගත පද්‍යයෙන් ප්‍රකට වෙයි. පිරිනිවන් මංචකයෙහි වැඩ
සිටි බුදු රජාණන් වහන්සේ එදින ලක් දිවට සැපත් වන විජය කුමාරයා සහිත පිරිසද,
ලංකාව ද බුද්ධ ශාසනය ද ආරක්ෂා කළ යුතු යයි ශක්‍ර දිව්‍ය රාජයාට නියම කළ සේක.
ඒ නියමය පිළිගත් ශක්‍ර දිව්‍ය රාජයා උත්පල වර්ණ දිව්‍ය රාජයාට ලංකා රක්ෂණය
පැවරූ බැව්

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

"තථාගතස්ස දෙවින්දො — වචො සුත්වාව සාදරො
දෙවස්සුප්පල වණ්ණස්ස — ලංකා රක්ඛං සමප්පයි"[30]

යන ගාථාවෙන් ප්‍රකට වෙයි. මේ උත්පල වර්ණ දිව්‍ය රාජයා අධිගෘහිත බැව් සලකන දෙවිනුවර සමීපයෙහි වූ තිලක පිරිවෙණ ද ගිහි පැවිදි ශිෂ්‍යයන්ට ධර්ම ශාස්ත්‍රීය ඥානය ලබා දුන් විද්‍යාපීඨයකි. මේ තිලක පරිවෙණාධිපති හිමිතුමා කාව්‍ය ඡන්දොලංකාර ශාස්ත්‍රයන් හි ද බෞද්ධ දර්ශනයෙහි ද සිංහල දෙමළ ආදි භාෂාවන් හි ද විශාරදයකු වූ බැව්,

දසන මතින් දූන හෙළු දෙමළ බණ තතු
වසන දෙවිනුවර යතිඳෙක් ලෙසට සිතු
දෙසන ලෙස එවූ මෙහසුන් රස නුමුතු
අසන මැනවි හිමි සිරි ලද මෙන් අමුතු[31]

යන පද්‍යයෙන් හෙළිවෙයි. ත්‍රි ලංකා හෙවත් තිලක නම් වූ පරිවෙණාධිපති මෙ තුමා දෙවිනුවර ඉරුගල් කුලයට කිරීට මාණික්‍යයක් වැනි වූ, යසසින් හා කීර්ති යෙන් යුක්ත වූ මුල්ගිරිගල විහාරාධිවාසී වූ යතීන්ද්‍රයන් වහන්සේගේ කණිටු සොහොයුරා වූහයි කියති. මේ යතීන්ද්‍රයන් වහන්සේ විසින් කවි දෙසිය දෙයානුවකින් යුත් සිංහල සන්දේශයන් අතර දීර්ඝතම සන්දේශය වූ කෝකිල සන්දේශය රචනා කරණ ලද බැව්,

උස දෙව් නුවර දිසි ඉරුගල් කුලට කිරුළ්
යස සිරි වඩන නිසි ගිරි වැසි නෙරිඳු එමල්
තොස යුතු තිලක පිරුවන් හිමි පවර තිමල්
රස කර පැවසූ පරපුටු සඳෙසරුත් ලකල්[32]

යනුවෙන් සඳහන් වන පද්‍යයෙන් හෙළිවෙයි. මේ තිලක පිරිවෙණ සන්දේශ කර්තෘ වරයන්ගේ වර්ණනාවන්ට ලක් වී නැතත් පරිවෙණාධිපතීන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය අනුව කිව යුත්තේ තිලක පිරිවෙණ තත්කාලීන ශ්‍රේෂ්ඨ විද්‍යාස්ථානයක් වශයෙන් හැඳින්විය යුතු බවයි.

5. පැපිලියානේ සුනේත්‍රා දේවී පිරිවෙණ :

ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ රාජධානිය කර ගෙණ විසූ ස වන සිරි පැරකුම්බා රජතුමා විසින් ම පිහිටුවන ලද පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙණ කෝට්ටේ යුගයට අයත් පිරිවෙන් අතුරෙන් ශ්‍රේෂ්ඨතම විද්‍යාස්ථානයක් වූ බැව් කිව යුතුය. ස වන සිරි පැරකුම්බා රජතුමා විසින් සුනේත්‍රා දේවිය නම් වූ ස්වකීය මෑණියන්ගේ ස්මාරකයක් වශයෙන් එතුමියට පින් පිණිස එතුමියගේ නමින් සුනේත්‍රා දේවී නම් පිරිවෙණ ආරම්භ කරණ ලදී. ඒ බැව්,

"අත්තනො මාතු අත්ථාය — තස්සා නාමෙන පඤ්ඤ වා
පප්පට කානනෙ තස්මිං — සුනෙත්ත පරිවේණකං"[33]

යන ගාථාවෙන් ප්‍රකාශ වෙයි. සුනේත්‍රා දේවි නමින් මේ පිරිවෙණ ආරම්භ කළ රජතුමා එහි සංඝාවාසයක් ද කරවා කෙත්වත් ආදිය ද පූජා කෙළේය. ඒ පිරිවෙණේ දී

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

අටුවා, ටීකා, සහිත ත්‍රිපිටකය ද ග්‍රන්ථාරූඪ කර වූ බව ද ඒ ත්‍රිපිටකය ලියූ ලේඛකයන්ට ගම්වර දුන් බව ද සිංහල මහා වංශයෙහි[34] සඳහන් වෙයි. විල්හෙල්ම් ගෛගර් පඬිතුමා විසින් පරිවර්තිත ඉංග්‍රීසි මහා වංශයෙහි ද[35] සඳහන් වෙයි.

ස වන සිරි පැරකුම්බා රජතුමා බුද්ධත්වය ප්‍රාර්ථනා කොට පැපිලියාන නම් ගමෙහි දෙමහල් ප්‍රතිමා මන්දිරයක් ද ස්වකීය මව් බිසොව ගේ නමින් පිරිවෙණක් ද කරවා මහා සංඝයා වහන්සේට පූජා කළ බව සිරි රහල් මා හිමියන් විසින් විරචිත පරෙවි සන්දේශයෙහි මෙසේ සඳහන් වෙයි.

| | |
|---|---|
| සුවිමල් ලමැණි කුල – තිලකෙව් උදුල සම | කල |
| සිරිසඳ තොසින් රැඳි කුසුමෙව් නොකල | ම්බා |
| සිරි යස තෙදැති නරනිඳු මේ පැරකුම් | බා |
| පතා බුදු සිරි සව් – සත වෙන කුළුණු | දියුණු ව |
| | |
| කරවා දෙමාලින් බුදු මැදුරක් | මහ රු |
| පුරවා සව් සිරින් ක්‍ර තෙ සිත | පිවිතු රු |
| | |
| සිය ගුරු බිසෝ හිමි සඳ නමිනි පිරිවෙණ | ක් |
| කරවා පැපිලියානෙහි මහ සහන තොයෙ | ක් |
| වසනුව දෙවූ වෙහෙරට පිවිස තොසිනුද | ක් |
| ඉඳ සැනැපී ගත සරතැස නිවා මඳ | ක්[36] |

අතිශයින් නිර්මල වූ ලම්බකර්ණ ගොත්‍රයට තිලකයක් වැනි වූ ශ්‍රී සෞභාග්‍යයෙන් හා තෙජොබල පරාක්‍රමයෙන් සම්පූර්ණ වූ ස වන පැරකුම්බා රජතුමා ස්වකීය මෑණියන්ට පින් පිණිස පැපිලියානෙහි දෙමහල් බුද්ධ මන්දිරයක් සාදවා මහා සංඝයා වහන්සේට පූජා කළ බව මෙයින් ප්‍රකට වෙයි. ගිරා සන්දේශ කෝකිල සන්දේශ වල ද මේ අදහස් ම ඇතුළත් වී ඇත.

ස වන සිරි පැරකුම්බා රජතුමාගේ රාජ්‍යොදයෙන් එකුන් සාළිස් වසෙහි මැදින් මස පුර පසළොස්වක් පොහෝද ස්වකීය මවු බිසොවට පින් පිණිස පැපිලියානේ සුනෙත්‍රා දේවී පිරිවෙණ ද විහාරස්ථානය ද කරවීමට රජතුමා නියම කළ බවත් එහි ආධිපත්‍යයට ගලතුරු මූල මේධංකර මහ තෙරණුවන්ගේ ශිෂ්‍යයෙකු වූ මංගල හිමියන් පත් කළ බවත් පැරකුම්බා රජතුමා විසින් පිහිටුවන ලද පැපිලියානේ සෙල්ලිපියෙහි ඇති වාක්‍යයක් මෙහි දක්වනු ලැබේ. "ශ්‍රී බුද්ධ වර්ෂයෙන් එක් දහස් නවසිය අට පනස් අවුරුද්දක් පිරුණු සඳ සිරිලක රජ පැමිණි මහ සම්මත පරම්පරානුයාත සූර්‍ය්‍ය වංශාභිජාත මහා රාජාධිරාජ ශ්‍රී සංඝබොධි ශ්‍රී පරාක්‍රමබාහු චක්‍රවර්ති ස්වාමීන් වහන්සේට එකුන් සාළිස් වන මැදින් දින පුර පසළොස්වක ජයවර්ධන පුරවරයෙහි සුමංගල ප්‍රාසාදාභිමුඛ චිත්‍ර මණ්ඩපයෙහි සිංහාසනයෙහි සිරි නිවෙස් සහ වොටුනු සිවු සැට බරණින් සැදි රජ යුව රජ ඇමති ගණ පිරිවරා දෙවෙන්ද්‍ර ලීලාවෙන් වැඩ හිඳ හැම තන්හි කළමනා කටයුත්තට ව්‍යවස්ථා වදරණ තැන ස්වර්ගස්ථ වූ මවූ බිසවුන් වහන්සේට පින් පිණිස අභිනව විහාරයක් කරවන ලෙසට රාණි වාසල කාරියෙහි නියුක්ත සිකුරා මුදල් පොතුන්ට වදළ මෙහෙවරින් පස් විසි දහසක් ධන වියදම් කොට පාෂාණ මුණු බඳ පැපිලියානෙහි ප්‍රාකාර ගොපුර ප්‍රතිමා ගෘහ මණ්ඩප බොධි චෛත්‍ය

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

සාවාස දෙවාලය පුස්තකාලය පුෂ්පාරාම ඵලාරාමාදියෙන් යුක්ත කොට සමෘද්ධ රවූ විහාරය චිරස්ථායීව වර්ධනය වන පිණිස පිදූයෙන්. . . පළමුවෙන් මහ බිසෝ මින්ගේ ශ්‍රී නාමයෙන් සුනේත්‍රා මහා දේවී පිරුවන් අස්වා මෙහි විහාරයට නායකව මිණි ගලතුරු මූල මේධංකර මහා තෙර සාමීන්ගේ ශිෂ්‍ය නිශ්‍රයෙන් මුක්ත මංගල මීන්ට සුනේත්‍රා මහ දේවී පිරිවෙන් තෙර අස්වා ඉදිරියේ දවස මොබ වහන්සේ ගේ රුශිෂ්‍ය පරම්පරාවෙන් අසා පිරිවානා තැන් කියා ශාසන වර්ධනය කිරීමට යොග්‍ය තැනකට පිරිවෙන පවත්නා නියායෙන් සනිටුහන් කොට[37]

මේ සෙල් ලිපියෙන් සුනේත්‍රා දේවී පිරිවෙන් විහාරයේ තොරතුරු රාශියක් ළි වෙයි. පැපිලියානේ සුනේත්‍රා දේවී පිරිවෙණ ද, විහාරය ද එක ම ආයතනයක් ය. මංගල තෙරණුවෝ විහාරයෙහි ද පිරිවෙණෙහි ද අධිපතිත්වය දැරූහ. ගිරා සන් දේශ කතුවරයා දස පද සැහැල්ලකින් මේ මංගල හිමියන්ගේ ගුණ වැණුමක් මෙසේ දිරිපත් කරයි.

"ඒ වෙහෙර තුරු රඳන - මනහර මහරු සහ ගුණ
මෙතින් සොඳුරු පිරිසිඳු හිය මගෙහි යොද
නිතින් තිලෝගුරු හට පිළිවෙතින් පුද
හර දළ නෙතග වන් - හිමි තව තෙදින් බබලන

අමාකර විනය සුත් අබි දහම් පෙළ
තමා නැණ තරිඳු කිරණින් උදම් කළ

නොමඳ වියත් ගහ රළැ වැල සේ පුබුදු
නිබඳ දිමුත් සිවු පිරිසිඳු සිල් පුරුදු
පැහැද මහත් මුනි බණ දෙසුමෙහි පසිඳු
නැමැද සුනෙත් මහ දෙවි පිරුවන් තෙරිඳු"[38]

සුනේත්‍රා දේවී පිරුවන්පති වූ ද විහාරාධිපති වූ ද මංගල හිමියන් භික්ෂු සංඝයා ලනය කිරීමට සමත් වූ ද ත්‍රිපිටක ධර වූද, ධර්ම දේශනාවෙහි දක්ෂ වූද, මහා යති රයෙකු වූ යි ගිරා කතුවරයා මෙයින් හෙළි කරයි. පිරිවෙන්පති මංගල හිමිපාණන් ගේ පාණ්ඩිත්‍යයත්, සුශීලත්වයත්, විශාරදත්වයත් නිසා සුනේත්‍රා දේවී පිරිවෙණ ත් කාලීන ශ්‍රේෂ්ඨ විද්‍යා ස්ථානයක් වූ බැව් අප විසින් පිළිගත යුතුය. සුනේත්‍රා දේවී රිවෙණ සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත, ධර්ම විනය, ඡන්දස්, තර්ක, ව්‍යාකරණ, තිහාස, පුරාවිද්‍යා දී විෂයයන් ඉගැන් වූ ප්‍රසිද්ධ පිරිවෙණකි. මෙහි ඉගැන්වීම ණක් නොව ත්‍රිපිටකය අටුවා ටීකා සහිතව ග්‍රන්ථාරූඪ කිරීමේ කටයුතු ද කළ බැව් ඓතිහාසික පුරාවෘත්තයන්ගෙන් ප්‍රකට වෙයි.

කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳව තවත් කරුණු සඳහන් කළ කි නමුත් මේ සංක්ෂිප්ත විවරණය මෙතෙකින් නිම කරමි.

**සටහන්:**

1. මහා වංශෝ 579 පිටුව 89 පරිච්ඡේදය.
2. මහා වංශෝ 579 පිටුව බුද්ධ දත්ත නාහිමි.
3. නිකාය සංග්‍රහය.
4. මයුර සන්දේශය 46 කවිය කුමාරතුංග සංස්කරණය.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

5. මහාවංසය 58—59 පිටු. වීරසේකර සංස්කරණය.
6. කාලිංග දෙස සංරතා භූමිකිල කුලොද්භවා
සුනෙත්‍රා නාම දෙවී යා     පරාක්‍රම භුජං ප්‍රසූඃ
ධර්මාශොක නෘපාන්වයෙ     ජයමාලො මහීපතිං
තස්‍ය පුත්‍රඃ ප්‍රජා ශ්‍රීයෙ     පරාක්‍රම භුජො' භවත්
වෘත්ත රත්නාකර පංචිකාව 47—48 පද්‍ය. 20 පිටුව සීලක්ඛන්ධ සංස්කරණය
7. ලැබුණි ජය මහලැන හිමි සුරතුර වෙලු රන්     ලියයුරු
සුනෙත් මහ දෙවි බිසෝ හිමි ලත් රජවරුන් සොඳ     බුදුකුරු
පැරකුම්බා සිරිත 27 පද්‍ය. කේ. ඩී. පී. වික්‍රමසිංහ සංස්කරණය.
8. ලමැණි කුල පිවිතුරු — ජය මහ ලැන මන පිරු
ගුණ ගණ මිණි සයුරු — සියල් නිරිඳුන් මුදුන් මල්යුරු
කාව්‍යශේඛරය 15 සර්ගය 29 කවිය.
9. මහා වංසය 618—619 පිටු වීරසේකර සංස්කරණය
10 ගිරා සන්දේශය. 135—136 කවි. කුමාරතුංග සංස්කරණය.
11. යාවය කථං සවිකසුව — පිටකත්තය මුත්තමං
ලිඛාපෙත්වාන බුද්ධස්ස — සාසනං සංගහං අකා
සද්ධම්ම පොත්ථකා නෙව — දිවසෙ දිවසෙ තදා
ලෙඛනත්ථාය ගාමාදිං — ලේඛකානං අදාසි සො
මහා වංසො. 580 පිටුව. 27—28 ගාථා.
12. සාරත්ථ දීපනී
13. විමති විනොදනී 13—154 පිටු.- බෙරතුඩුවේ ධම්මාධාර තිස්ස සංස්කරණය.
14. අනුත්තාකත්ථ දීපනී.
15. සද්ධර්මාලංකාරය. 516 පිටුව.- මකුලුදුවේ පියරතන නාහිමි සංස්කරණය.
16. උම්මග්ග ජාතකය.
17. විසුද්ධි මග්ග 316 පිටුව.- දිබ්බ සොත ධාතු කථා.
මහාවංසය 596 පිටුව. වීරසේකර සංස්කරණය.
18. කෝට්ටෙ යුගයේ සිංහල සාහිත්‍යය .79 පිටුව ආචාර්ය කේ. ඩී. පී. වික්‍රමසිංහ
19. හංස සන්දේශය. 181 කවිය.
20. හංස සන්දේශය. 201 කවිය. ආචාර්ය කේ. ඩී. පී. වික්‍රමසිංහ සංස්කරණය.
21. Ancient inscriptions in Ceylon (1883) 72 පිටුව.
22. හංස සන්දේශය. 173, 174, 175, 178, 179, 180, 181, 182
කේ. ඩී. පී. වික්‍රමසිංහ සංස්කරණය.
23. හංස සන්දේශය. 193 කවිය.
24. මහාවංසො. අඨාසීතිමො පරිච්ඡෙදෙ. 88, 89, 90, 91, 92 ගාථා
576—577 පිටු. බුද්ධදත්ත ථෙර. සංස්කරණය.
25. ගිරා සන්දේශය. 62 පිටුව. 219, 220, 221, 225, 227.
26. සිංහල සාහිත්‍ය වංශය. 256 පිටුව. ආචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගල.
27. මහාවංසො. 88 පරිච්ඡේදය. 577 පිටුව. 98, 99 ගාථා
බුද්ධදත්ත ථෙර සංස්කරණය.
28. මයුර සන්දේශය. 72 කවිය. කුමාරතුංග සංස්කරණය.
29. කෝකිල සන්දේශය. 30 කවිය. පණ්ඩිත ගුණවර්ධන සංස්කරණය.
30. මහාවංසො. 42 පිට. 5 ගාථාව. බුද්ධදත්තථෙර සංස්කරණය.
31. කෝකිල සන්දේශය. 287 කවිය.
32. කෝකිල සන්දේශය. 292 කවිය. පණ්ඩිත ගුණවර්ධන සංස්කරණය.
33. මහාවංසො. 89 පරිච්ඡෙදය. 24 ගාථාව. බුද්ධදත්ත ථෙර සංස්කරණය.
34. සිංහල මහා වංසය. 619 පිටුව.
35. for memory of his mother the meritori ous (King) had erected in the Pappata grove in her name the Sunethra Berewers and a monastery for the community and granted it many villeges and fields - 216 P Wilhelm **Gyger**.
36. සිරි රහල් පබද. 49 කවිය. ඒ තෙන්නකෝන්.
37. කෝට්ටෙ යුගයේ සිංහල සාහිත්‍යය. 106 පිටුව. ආචාර්ය කේ. ඩී. පී. වික්‍රමසිංහ
38. ගිරා සන්දේශය. 69 කවිය. මුනිදස කුමාරතුංග.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk